# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

## ජාතික සංචාරක මාර්ගෝපදේශක පාඨමාලාව

( ඉංග්‍රීසි හැර වෙනත් භාෂා හැසිරවීමේ නිපුණතාවයක් ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ )



### ඇතුළත් වීම සඳහා සැපිරිය යුතු සුදුසුකම්

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන්ගේ වයස ඉල්ලුම්පත් යොමු කළ යුතු අවසන් දිනය යෙදෙන දිනට අවුරුදු 18ත් 65 ත් අතර විය යුතු ය.

**සහ**

- අ.පො.ස (උ/පෙළ ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක් තුළ සියලු විෂයන් එක් වරකදී සමත්ව තිබිය යුතු වීම

**හෝ**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාල උපාධියක් ලබා තිබිය යුතුය.

**හෝ**

- බලපත්‍රලාභී සංචාරක රියදුරු මාර්ගෝපදේශවරයෙකු ලෙස වසර 05 ක අඛණ්ඩ සේවා පළපුරුද්දක් තිබීම

**හෝ**

- NVQ 04 මට්ටම සහිත සංචාරක මාර්ගෝපදේශ වැඩසටහනක් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

- බලපත්‍රලාභී ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශවරයෙකු ලෙස වසර 08 ක අඛණ්ඩ සේවා පළපුරුද්දක් තිබීම.

### භාෂා ප්‍රවීණතාවය

- ජාතික සංචාරක මාර්ගෝපදේශක පාඨමාලාව - ඉංග්‍රීසි භාෂාව සඳහා
  අ.පො.ස (සා/පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව සමත් වීම.
- ජාතික සංචාරක මාර්ගෝපදේශක පාඨමාලාව - ඉංග්‍රීසි හැර වෙනත් භාෂා
  එකී භාෂාව, මව් භාෂාව වන රටක අවම වශයෙන් වසර 05ක් වාසය කිරීම හා වෘත්තියක නියැලීම සහ එම කරුණු සනාථ කිරීමට අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය.

**හෝ**

සංචාරක මාර්ගෝපදේශයකු ලෙස ක්‍රියා කිරීමට බලාපොරොත්තු වන්නාවූ භාෂාව සඳහා පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද භාෂා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

### පාඨමාලා කාලය

මාස 05 ( පූර්ණ කාලීන )

### පාඨමාලා ගාස්තුව

රු.152,000.00 ( ලියාපදිංචි ගාස්තුව සහ විභාග ගාස්තුව ඇතුළුව )

### පාඨමාලා පවත්වන ස්ථානය

කොළඹ පාසල

### අයදුම් කළ යුතු ආකාරය

www.slithm.edu.lk වෙබ් අඩවිය මගින් මාර්ගගත ක්‍රමයට අයදුම්පතක් යොමු කරන්න. පාඨමාලාව සදහා අයදුම්පත් ගාස්තුව ලෙස රු.500ක මුදලක් අය කෙරේ. පහත ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තුව බැර කර ලදුපත උඩුගත කරන්න.
**(BOC ආයතනික ශාඛාව - 0007120156)**
**වැඩි විස්තර සදහා Slithm වෙබ් අඩවිය බලන්න.**

### තෝරා ගැනීමේ ක්‍රියාවලිය

අයදුම්කරුවන් ආයතනය මගින් පවත්වන ලිඛිත පරීක්ෂණය,භාෂා පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය සඳහා මුහුණ දිය යුතුය. භාෂා පරීක්ෂණය සඳහා රු. 5000/= අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ.

### වෙනත් තොරතුරු

- ඔබගේ අයදුම්පත සාර්ථකව යොමු කළ විට ඒ බව ඊමේල් පණිවිඩයක් මගින් දැනුවත් කරන අතර ඉදිරි පියවරයන්හිදී ඊමේල් මගින් පමණක් ඔබව දැනුවත් කරනු ඇත.
- ප්‍රංශ, ජර්මානු, කොරියානු, ඉතාලි, චීන, ස්පාඤ්ඤ, හින්දි, රුසියානු, ජපන් හෝ ග්‍රීක භාෂා ප්‍රවීණතාවය ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
- යම් අයදුම්කරුවකු වෙනුවෙන් ආයතනය වෙත සිදු කෙරෙන සියලු ආකාරයේ බලපෑම් පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

### අයදුම්පත් භාරගන්නා අවසාන දිනය

**2026-05-31**

ලේඛකාධිකාරී - ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, නො 78, ගාලු පාර, කොළඹ 03
වෙබ් අඩවිය - www.slithm.ed.lk | විමසීම් - 011 220 8312